# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1991 අංක 23 දරන
# මුදල් සමාගම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 ජූනි මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 ජූනි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය

මිළ : ශත 90 යි. තැපැල් ගාස්තුව රු. 1.00 යි.

# 1991 අංක 23 දරන මුදල් සමාගම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 ජූනි මස 20 වන දින.]

එල්. ඩී.—ඕ. 84/90

## 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1991 අංක 23 දරන මුදල් සමාගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 5 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර, එය ඒ පනතේ 5අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතුය :— **1988 අංක 78 දරන පනතෙහි 5 අ වගන්තිය ඇතුලත් කිරීම.**

"තැන්පත් මුදල ගෙවීමට අපොහොසත් වීම වරදක් වන බව.

5අ. (1) තැන්පත් මුදලක් කල්පිරුණු දින හෝ ඉන් පසුව ඒ මුදල ගෙවන ලෙස තැන්පත්කරුවකු විසින් ඉල්ලා සිටි විට ඒ තැන්පත් මුදල සහ ඒ මත පොලිය ගෙවීමට යම් මුදල් සමාගමක් අපොහොසත් වන අවස්ථාවක, ඒ සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකුම, කළමනාකරුවකු හෝ ලේකම්වරයකුම මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේය :

එසේ වුවද ඒ වරද සිදුකරන ලද්දේ තමාගේ අනුදැනුම නොමැතිව සහ ඒ වරද සිදුකිරීම වැළැක්වීම පිණිස තමා විසින් සියලු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කර ඇති බව ඔහු විසින් ඔප්පු කළහොත්, ඒ අධ්‍යක්ෂවරයා, කළමනාකරු හෝ ලේකම්වරයා ඒ වරදට වරදකරු නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නියමයන් අනුව තමාගේ තැන්පත් මුදල සහ පොලිය කල්පිරුණු විට නොගෙවනු ලැබ ඇති යම් තැන්පත්කරුවකු විසින්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 වන වගන්තියේ නියමයන් අනුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු පැවරිය හැකි ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය එහි (1) වන උප වගන්තියේ (ඩ) ඡේදයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(ණ) මුදල් සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට හෝ සේවා නියුක්තයන්ට වැටුප්, දීමනා, අතිරේක ලාභ සහ වැය ප්‍රතිපූරණ වශයෙන් ගෙවන පාරිශ්‍රමික සහ වෙනත් ගෙවීම්.".

2—ඩී 012938—5,690 (91/03)

ප්‍රධාන ප්‍රඥප්තියේ 12අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 12අ වගන්තියට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 12ආ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

" ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු මුදල් සමාගමේ එහි නියෝජිතයා වශයෙන් පත් කිරීම.

12ආ. (1) මේ පනත යටතේ ලියාපදිංචි කර ඇති සෑම මුදල් සමාගමකටම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් එහි නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු, එම සමාගමේ කටයුතු සමීක්ෂණය කිරීමේ කාර්යය සඳහා පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ නියෝජිතයකු විසින්, 12 වන වගන්තියෙන් අධ්‍යක්ෂවරයා වෙත පැවරී ඇති සියලු බලතල ක්‍රියාත්මක කිරීම හා මෙහි පහත සඳහන් කටයුතු කිරීම ද නීත්‍යනුකූල වන්නේ ය :—

(අ) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් වලට සහභාගිවීම සහ ඔහුගේ අදහස අනුව සමාගමේ තැන්පත්කරුවන්ගේ සහ ණයහිමියන්ගේ සම්බන්ධතාවන්ට හෝ ජාතික ආර්ථිකයට හෝ අනර්ථකාරී විය හැකි යම් කාරණයක් පිළිබඳ තීරණයකට එළඹීම පැය හතළිස් අටක් නොඉක්මවන කාලයකට විලම්බනය කරන ලෙස ඒ අධ්‍යක්ෂ මණ්ඩලයට නියම කිරීම. එවැනි නියමයකට අනුව ක්‍රියා කිරීම ඒ අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යය වන්නේ ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉන්පසුව මුදල් මණ්ඩලයේ සභාපතිවරයාගේ ලිඛිත එකඟත්වය ඇතිව පමණක්, එම කාරණය සම්බන්ධයෙන් තීරණයක් කළ හැකි ය.

(ආ) ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම කැඳවීම අවශ්‍ය යැයි ඔහු සලකන අවස්ථාවල එම අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම කැඳවීම.

(ඇ) ඒ සමාගමේ කටයුතු සමීක්ෂණය කිරීමේ දී සහ අධීක්ෂණය කිරීමේ දී ඔහුට සහාය වීම පිණිස වෘත්තීය හෝ විශේෂඥ කාර්ය මණ්ඩල සේවයේ නියුක්ත කර ගැනීම.

(3) යම් මුදල් සමාගමක අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ලේකම්වරයකු, සේවා නියුක්තයකු හෝ විගණකවරයකු වෙත මේ වගන්තිය යටතේ පැවරෙන යම් නියමයක් අනුව ක්‍රියා කිරීම සහ අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලා සිටිනු ලැබූ විට

නියෝජිතයාට හෝ ඔහු විසින් බලය දෙන ලද යම් විගණකවරයකුට හෝ ඔහු විසින් (2) වන උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ සේවයේ නියුක්ත කර තිබෙන යම් තැනැත්තකුට ඒ මුදල් සමාගමේ මුදල් ශේෂය, වත්කම් සහ බැරකම් ඇතුළුව සියලු පොත්පත්වලට සහ වාර්තාවලට ප්‍රවේශය ලබාදීම ඒ සෑම අධ්‍යක්ෂවරයකුගේම කළමනාකරුවකුගේම, ලේකම්වරයකුගේම, සේවා නියුක්තයකුගේම හෝ විගණකවරයකුගේම කාර්යය වන්නේ ය.

(4) ඒ නියෝජිතයා සහ ඔහුගේ සහායක කාර්ය මණ්ඩලය සේවයේ නියුක්ත කිරීමේ පිරිවැය මුදල් සමාගමෙන් අයකර ගත යුතු ය.

(5) නියෝජිතයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සේවයේ නියුක්ත කිරීමේ නියමයන් හා කොන්දේසි, මණ්ඩලය විසින් නිශ්චය කළ යුතු ය.

(6) නියෝජිතයා විසින් මේ වගන්තිය යටතේ ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීම, අධ්‍යක්ෂවරයාගේ විධානය සහ අධීක්ෂණය යටතේ කළ යුතු ය.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) අධ්‍යක්ෂවරයාගේ වාර්තාවක දක්වා ඇති සිද්ධි සහ අවස්ථාගත කරුණු සමාලෝචනය කිරීමෙන් පසුව මුදල් සමාගමක ආදි හෝ වර්තමාන අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායකයකු, කළමනාකරුවකු, සේවා නියුක්තයකු හෝ අනුයෝජිතයකු විසින්, සමාගමට අයිති යම් මුදලක් හෝ දේපළක් අයථා පරිදි යෙදවීමෙන් හෝ වෙනත් ආකාරයක අනිසි ලෙස උපයෝගී කිරීමෙන් වංචනික ලෙස, සාවද්‍ය ලෙස හෝ නීති විරෝධී ලෙස තමාම පොහොසත් වී ඇති බව හෝ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් පොහොසත් කර ඇති බව නැතහොත් නොකර හැරීමේ යම් ක්‍රියාවකින් සමාගමට අයත් මුදලක් හෝ දේපළක් අයථා පරිදි යෙදවීමෙන් හෝ වෙනත් ආකාරයක අනිසි ලෙස, උපයෝගී කර ගැනීමෙන් හෝ වංචනික ලෙස සාවද්‍ය ලෙස හෝ නීති විරෝධී ලෙස වෙනත් යම් තැනැත්තකුට පොහොසත් වීමට ශක්‍යතාව ලබා දී ඇති බව මණ්ඩලයේ මතය වන්නේ නම්, 18 වන හෝ 20 වන වගන්තිය යටතේ පියවර ගනු ලැබ ඇත්තේ වුව ද මුදල්

සමාගමට ආරෝපණය කරනු ලැබිය හැකි හෝ මුදල් සමාගමට අයත් යයි යුක්තිසහගත ලෙස සැක කරනු ලැබිය හැකි හෝ මුදල් සමාගමට අයත්ව තිබූ බවට යුක්තිසහගත ලෙස සැකකරනු ලැබිය හැකි වූ ද යම් වත්කමක් අත්කර ගැනීමට යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට හෝ යම් ණයක් හෝ බැරකමක් නිදහස් කිරීමට උපයෝගි කරනු ලැබූ වියදම් කරනු ලැබූ මුදල් හෝ දේපළ, ඒ මුදල සහ දේපළ මත, සුදුසු යැයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන පොලිය සමඟ මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදයක් ඇතුළත ආපසු ගෙවන ලෙස හෝ පුනස්ථාපනය කරන ලෙස ඒ

අධ්‍යක්ෂවරයාට, ප්‍රධාන විධායකයාට, කළමනාකරුට, සේවා නියුක්තයාට, අනුයෝජිතයාට හෝ වෙනත් යම් තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.”.

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) එහි (උ) ඡේදයේ—

(i) “ආරෝපණය කළ හැකි මුදල්වලින් මිලට ගත් දේපළ හෝ වත්කම්” සහ “දැන්වීමේ නිශ්චිතව සඳහන්” යන වචන වෙනුවට පිළිවෙළින් “ආරෝපණය කළ හැකි මුදල් අනිසි ලෙස උපයෝගී කිරීමෙන් හෝ අයථා ලෙස යෙදවීමෙන් මිලට ගන්නා ලද හෝ වෙනත් යම් ආකාරයකින් අත්කර ගන්නා ලද දේපළ හෝ වත්කම්” සහ “දැන්වීමේ නිශ්චිතව සඳහන්” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ii) “මේ ඡේදය යටතේ නිකුත් කරන ලද” යන වචන සිට ඒ ඡේදයේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

“මේ ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම දැන්වීමක්ම, දින අනූවක කාලයක් බලාත්මකව පැවතිය යුතු අතර, (උ) ඡේදය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් බලාත්මකව පවත්නා කාලය තුළ ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් යම් දේපළක හෝ වත්කම්වල අයිතිය, සන්තකය හෝ වෙනත් සම්බන්ධතා පිළිබඳව යම් පැවරීමක් ශූන්‍ය හා බලරහිත වන්නේ ය.”;

(ආ) එහි (එ) ඡේදයේ “නියම කළ හැකි ය;” යන වචන වෙනුවට “නියම කළ හැකි ය. තවද දැන්වීමක් බලාත්මකව පවත්නා කාලය තුළ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා, මෝටර් වාහන කොමසාරිස්

වරයා සහ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සහ ඒ දැන්වීමේ පිටපතක් (උ) ඡේදය යටතේ භාර දෙනු ලැබූ වෙනත් අදාළ බලධරයකු විසින්, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දේපළට හෝ වත්කම්වලට අදාළ යම් පැවරීමේ ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් හෝ හිමිකම සම්බන්ධ වෙනත් ලේඛනයක් ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය;" තවද

(ඈ) එහි (ඕ) ඡේදයේ—

(1) (ii) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :—

"(ii) (i) වන අනුඡේදය යටතේ දිසා අධිකරණයක් වෙත ඉල්ලීමක් කරනු ලැබීමෙන් පසුව සහ (1) වන උපවගන්තියෙහි සඳහන් මුදල් සමාගමක ආදි හෝ වර්තමාන අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායකයකු, කළමනාකරුවකු, සේවා නියුක්තයකු හෝ අනුයෝජිතයකු විසින් සමාගමට අයත් යම් මුදලක් හෝ දේපළක් අයථා පරිදි යෙදවීමෙන් හෝ වෙනත් ආකාරයකින් අනිසි ලෙස උපයෝගී කිරීමෙන් වංචනික ලෙස, සාවද්‍ය ලෙස හෝ නීති විරෝධී ලෙස තමාම පොහොසත් වී ඇති බව හෝ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් පොහොසත් කර ඇති බව, නැතහොත් නොකර හැරීමේ යම් ක්‍රියාවකින්, සමාගමට අයත් මුදලක් හෝ දේපළක් අයථා පරිදි යෙදවීමෙන් හෝ වෙනත් ආකාරයක අනිසි ආකාරයක උපයෝගී කිරීමෙන් වංචනික ලෙස, නීති විරෝධී ලෙස හෝ සාවද්‍ය ලෙස වෙනත් යම් තැනැත්තකුට පොහොසත් වීමට ශක්‍යතාව ලබාදීම කර ඇති බවට දිසා අධිකරණය සෑහීමට පත්වන්නේ නම්—

(අ) මුදල් සමාගමේ ඒ අධ්‍යක්ෂවරයාට, ප්‍රධාන විධායකයාට, කළමනාකරුට, සේවා නියුක්තයාට හෝ අනුයෝජිතයාට හෝ එසේ පොහොසත් වූ වෙනත් යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට අයත් යම් දේපළක් හෝ වත්කම්; හෝ

(ආ) මුදල් සමාගමේ ඒ අධ්‍යක්ෂවරයා, ප්‍රධාන විධායක, කළමනාකරු, සේවා නියුක්තයා හෝ අනුයෝජිතයා වෙනුවෙන් ඥාතියකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් භාරයක් වශයෙන් දරනු ලබන යම් දේපළක් හෝ වත්කම්; හෝ

(ඇ) මුදල් සමාගමේ වත්කම්වලට ආරෝපණය කළ හැකි මුදල් වලින් අත්කර ගනු ලැබූ හෝ මිලට ගනු ලැබූ යම් දේපළක් හෝ වත්කම්

තහනමට ගෙන විකිණීමට පිස්කල්වරයාට බලය දෙන සහ ඔහු නියම කෙරෙන ක්‍රියාවේ යෙදවීමේ රිට් බල පත්‍රයක් නිකුත් කිරීමට විධාන කළ යුතු ය.

(iii) (ඔ) ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ නිකුත් කරන ලද රිට් බල පත්‍රයක් අනුව යම් දේපළක් හෝ වත්කම් විකුණනු ලබන අවස්ථාවක, මුදල් සමාගමට ආරෝපණය කරනු ලැබිය හැකිවූ ද අධිකරණය විසින් දරනු ලබන මුදල්වලට වැඩිවූ ද විකිණීමෙන් ලත් මුදල්වල යම් අතිරික්තයක් වෙතොත්, එය ඒ වත්කම්වල හෝ දේපළෙහි අයිතිකරුට ආපසු ගෙවනු ලැබිය යුතු ය.";

(ii) එම ඡේදයේ (iii) වන සහ (iv) වන අනුඡේද, (iv) වන සහ (v) වන අනුඡේද ලෙස නැවත අංක යෙදීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය, එහි (2) වන උප වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" (ඇ) මුදල් සමාගම් ව්‍යාපාරයේ කවර හෝ අංශයක් හා සම්බන්ධව ප්‍රකාශ පත්‍රයක් හෝ ප්‍රචාරක දැන්වීමක් යම් මුදල් සමාගමක් විසින් නිකුත් කිරීම විධිමත් කිරීම හෝ තහනම් කිරීම සහ එවැනි යම් ප්‍රකාශ පත්‍රයක් හෝ ප්‍රචාරක දැන්වීමක් නිකුත් කළ හැක්කේ යම් කොන්දේසිවලට යටත්ව ද, ඒ කොන්දේසි.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය මෙයින් ඉවත් කරන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය ප්‍රතිශෝජනය කිරීම.

" දණ්ඩන. 38. (1) මේ පනත යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකුම මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු අවුරුදු තුනකට වැඩි නොවූ කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් පණස් දහසකට අඩු නොවූ සහ රුපියල් එක් මිලියනයකට වැඩි නොවූ දඩයකට හෝ යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදකට වරදකරු බව නිරණය කරනු ලැබ දඩයක් ගෙවීමට අඥා කරනු ලබන සංස්ථාවක අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ලේකම්වරයකු විසින් හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක සාමාජිකයකු විසින් ඒ දඩය හෝ එහි යම් කොටසක් ගෙවීම සඳහා ඒ සංස්ථාවේ හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයේ යම් අරමුදලක් යොදා ගනු ලැබුවහොත් ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේය.

(3) මේ පනත යටතේ ලැබෙන සියලු දඩ මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන තැන්පත්කරුවන්ගේ සහන අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. ".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ " මුදල් සමාගම " යන යෙදුමේ අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

" මුදල් සමාගම් " යන්නෙන් 1982 අංක 17 දරන සමාගම් පනතේ අර්ථකථනය කරන ලද පරිදි වූ ද මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද්දා වූ ද සමාගමක් අදහස් වන අතර, මේ පනත යටතේ මණ්ඩලය විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් හෝ ගනු ලැබිය හැකි යම් පියවරක කාර්ය සඳහා 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලනය කිරීමේ පනතේ අර්ථානුකූල යම් ආයතනයක් ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයට ඉහතින්ම වූ දිනයෙහි ඒ ආයතනය විසින් මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම අවසන් කරනු ලැබුව ද, ඇතුළත් වන්නේ යයි සලකනු ලැබිය යුතු ය.

ක්‍රියා ආදිය වලංගු කිරීම.

9. 1990 නොවැම්බර් මාසයේ 20 වන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන්වන කාලසීමාව ඇතුළත, හදිසි අවස්ථා (මුදල් සමාගම්) නියෝග සමග කියවිය යුතු 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ කරන ලද ක්‍රියාවක්, කරන ලද නියමයක් හෝ දෙන ලද විධානයක්, ඒ නියෝග සෑදීමට මහජන ආරක්ෂක ආඥාපනතින් බලය දී තිබුණාක් සේ, වලංගු හා බල සහිත විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 ද, (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.